



# ලූ-පරාද-ලූ

Loo, යන වචනය ඉංග්‍රීසි ශබ්ද කෝෂයට එක්වුයේ එංගලන්තයෙන් නොව ඇමරිකාවෙනි. දැන් එය බොහෝ රටවල වැසිකිළිය සඳහා භාවිතා කරන වචනයක් බවට පත්වී තිබේ.

ලංකාවේ නම්, "ලූ" වචනය තදින්ම ප්‍රචාරය වුයේ පසුගිය ජනාධිපති වරණය සමයේදීය. බස් රථයේද දුම්රියේද ආපන ශාලාවේද සෑම තැනම අසන්නට ලැබුණේ අරෙහෙමලූ, මෙහෙමලූ යන වචනයන්. " දන්නවාද වැඩක් ? අර ඇපලෝ ඉස්පිරිතාලේ කෝටි ගනනකට රාජපක්ෂලා අරගෙනලූ." එකෙක් කියන විට තවෙකෙක් කියන්නේ, "අර ප්‍රසිද්ධ බටදෙල වත්ත බැසිල් රාජපක්ෂ කෝටි ගණනකට අරගෙනලූ එතන ඉඳගෙන ගම්පහ දිස්ත්‍රික්කෙට තරඟ කරනවලූ" මෙබඳු ප්‍රකාශ බොහොමයක්, මුල් බැස්සේ, මාතරින් බව කියවේ. අනිත් පැතිද නිකන් සිටියේ නැත. කෙසේ වුවද, ජනාධිපති වරණය දැන් අවසන්ය. මහා මැතිවරණයද අවසන්ය. එහෙත් ඔස්ට්‍රේලියාවේ සිටින අපට, පැහැදිලිව පෙනෙන එක කරුණක් ඇත.

ඕස්ට්‍රේලියාවේ, රාජ්‍ය අනුග්‍රහය ලබන බල සම්පන්න මාධ්‍යජාල දෙකක් තිබේ. මේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍යජාල දෙක, අන් සියළුම මාධ්‍ය ජාලයන් අභිබවා ජනතාව අතරට යයි. මේ මාධ්‍ය ජාල දෙක හැඳින්වෙන්නේ ABC. සහ SBS. යනුවෙනි.

දිනපතා සවස 6.30 සිට 7.30 දක්වා විකාශනය වන S.B.S. රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රචාරය, අති විශාල ජන සංඛ්‍යාවක් නරඹයි.

මහා මැතිවරණයේ අන්තිම සතියේ එක් දිනකදී මේ මාධ්‍ය ජාලයේ ප්‍රධාන ප්‍රවෘත්තියක් බවට පත්වී තිබුණේ, ලංකාවෙන් සහ ඇෆ්ගනිස්ථානයෙන්, නීති විරෝධිව එන සංක්‍රමනිකයන්ට, වැට බඳින්නට පියවර ගන්නා බවට පලමු ප්‍රවෘත්තියකිනි.

හුරුබුහුටි දෙමළ තරුණියක් (ඈ ඕස්ට්‍රේලියාවේ ඉපද, ඉගනීම ලැබූ තැනැත්තියකි. ඇය මෙසේ කීවාය.

"ශ්‍රී ලංකාවේ, දෙමල ජනතාවට කිසිම නිදහසක් නෑ. ඔවුන් දිනපතාම හිංසා පීඩා වලට ලක්වෙනව. මර්ධනය භයානකයි. ඒ නිසයි ඔවුන් දේශපාලන රැකවරණය ඉල්ලා එන්නේ "

ඊට මොහොතකට පසු, තවත් කාන්තාවකගේ අඳෙනාවක් අසන්නට ලැබේ. ඇය කතාකරන්නේ කොළඹ කොටුවේ දුම්රියපල ඉදිරිපිට සිටය. භික්ෂුන් ඇතුළු පිරිසක් රූප රාමුවේ දකින්නට ලැබේ. ඈ කතාකරන්නේ ඉංග්‍රිසියෙනි. ඈ මෙසේ කියයි.
'Our mother are shut. There is no democracy in their country." ඒ කතාකලේ අනෝමා ෆොන්සේකාය.

***සමරවීර මහතාට තමා මුලින්ම පාර්ලිමේන්තුවට පත්වී ආ 1989 පෙබරවාරි මැතිවරණය අමතක වුයේ කෙසේද? ඒ මැතිවරණයේ දී , නාමයෝජනා දිනයේ පටන්, මැතිවරණ දිනය දක්වා ගතවු සති කිහිපය තුල, විපක්ෂ අපේක්ෂකයන් 13 න් දෙනෙක් ඝාතනයට ලක්වුහ. ඔවුන් අතර මාතර දිස්ත්‍රික්කයේ අපේක්ෂකයෝ දෙදෙනෙක් වුහ.***

ඕස්ට්‍රේලියාවේ දෙමළ ඩයස් පෝරාව කොතරම් ප්‍රීතියට පත්වන්නට ඇද්ද ?

## විදේශීය බලපෑම්

ඉන්දියානු සාගර කලාපයේ, අධිපත්‍යය සඳහා නව යටත් විජිතවාදීන්, අර ඇන්දේ බොහෝ කලක සිටය. ඉන්දියාවේ හා ලංකාවේ, තමන්ට හිතවත් රාජ්‍යයන් පිහිට වීමටත් ඒ මගින්, ඉන්දියානු සාගර කලාපයේ ආධිපත්‍ය ලබාගැනීමටත් ඔවුන් දැරූ ප්‍රයන්තය. 1977 දී සාර්ථක විය. ඉන්දියාවේ හා ලංකාවේ, නව යටත් විජිතවාදින්ට හිතවත්, රාජ්‍යයන් බලයට පත්කිරීමට ඔවුන් සමත් වුහ. එහෙත්, තමන් උගුලකට අසුවු බව තේරුම් ගත් ඉන්දියානු ජනතාව, 1980 ජනවාරියේදී යලිත් මොවුන්ට අවශ්‍ය අන්දමේ රජයක් පත්කර ගත්තේය. එමනිසා, නව යටත් විජිතවාදී ප්‍රයන්තය අසාර්ථක විය. එහෙත් ඔවුන් වෑයම අතහැරියේ නැත.

දැන් අපි මෑත අතීතයට හා ශ්‍රී ලංකාව අතට හැරෙමු.

2002, ඊනියා අවබෝධතා ගිවිසුම (M.O.U) බිහිකරන ලද්දේ, නොර්වේ ප්‍රමුඛ බටහිර බලවේගයන් විසින් බව නොරහසකි. එහෙත්, මේ දක්වා රහසක්ම තිබු, තවත් බලපෑම් දැන් හෙලිවී තිබේ. පසුගිය ජනාධිපති වරණයේදී, සරත් ෆොන්සේකා මහතාගේ ප්‍රධාන සංවිධායකයා වු, සේනකද සිල්වා නැමැත්තෙක්, 2004 දී කරන ලද වරදකට බෙල්ජියමේ උසාවියක් මගින් ඔහු වර්ෂ දෙකක හිරදඬුවමකට, ලක් වු බවත්, තීන්දුව දෙන ලද්දේ මෑතකදී බවත්, බෙල්ජියම් රජය ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ඔහු ඉල්ලා සිටින බවත් හෙලි විය. 2004 දී , ඔහු ශ්‍රී ලංකා මුදලින් රු. පන්කෝටියක්, පමණ වටිනා යුරෝ මුදල් ප්‍රමාණයක්, නීතිවිරෝධි අන්දමින් ලංකාවට එවීම ගැන වරදකරුවී සිටී. මේ මුදල එවන ලද්දේ 2005 ජනාධිපතිවරණය සඳහා දැයි තවමත් හෙලිවී නැත.

එහෙත්, ජනාධිපතිවරණය අවසන් වු දිනට පසුවද, රු හත්කෝටි දසලක්ෂයක් වටිනා, (ඇමරිකානු ඩොලර් පන්ලක්ෂ හෑත්තැපන්දහසක්ද ඇතුළුව) ධනස්කන්ධයක් සරත් ෆොන්සේකා මහතාගේ, බෑනාගේ මවට අයිති බැංකු සේප්පුවක තිබී සොයා ගැනීමට රහස් පොලීසිය සමත් වී සිටී. එසේම තවත් මුදල් ගණුදෙනු පිළිබඳව ද තොරතුරු හෙලිවෙමින් පවතී.

මේ සියළු හෙලිදරව් වලින් ජනතාව තුල සැකයක් ඇති වේනම් එය සාධාරණ නොවන්නේද ? විදේශීය බලපෑම් තදින්ම ක්‍රියාත්මක වන බව, බොහෝ දුරට ඔප්පු නොවන්නේද?

## සාධාරණ මැතිවරණ ?

පසුගියද, අවසන් වු, මහ මැතිවරණයේදී ඡන්ද කොට්ටාස 160 න් දෙකක (නාවලපිටිය සහ ත්‍රිකුණාමලය) අක්‍රමිකතා නිසා, ඒවායේ මැතිවරණය යලිත් පැවැත්වෙන බව ප්‍රකාශ කර තිබේ. මේ සිද්ධි නිසා මෙම මැතිවරණය, ඉතිහාසයේ භීෂණකාරී මැතිවරණය බව ප්‍රකාශ කරන්නේ මංගල සමරවීර මහතාය.

සමරවීර මහතාට තමා මුලින්ම පාර්ලිමේන්තුවට පත්වී ආ 1989 පෙබරවාරි මැතිවරණය අමතක වුයේ කෙසේද? ඒ මැතිවරණයේ දී , නාමයෝජනා දිනයේ පටන්, මැතිවරණ දිනය දක්වා ගතවු සති කිහිපය තුල, විපක්ෂ අපේක්ෂකයන් 13 න් දෙනෙක් ඝාතනයට ලක්වුහ. ඔවුන් අතර මාතර දිස්ත්‍රික්කයේ අපේක්ෂකයෝ දෙදෙනෙක් වුහ. ඒ අතර ඉන්ද්‍රපාල අබේවීර වැනි සම්මානනීය විද්වතුන්ද වුහ.

මෙහිදී එ.ජා.ප. අපේක්ෂකයින් එක්කෙනෙකු හෝ ඝාතනය නොවුයේ භීෂණකාරී ජනතා විමුක්ති පෙරමුණ ඔවුන් අනුකම්පා කල නිසා නොවේ. සෑම එජාප අපේක්ෂකයෙක්ම, මැතිවරණ කටයුතුවල යෙදුනේ, හමුද රථ 4ක හෝ 5 ක ආරක්ෂාව ඇතුව නිසාය.

එම නිසා, මේ මැතිවරණයේ සාධාරණ, අසාධාරණකම් ඉහත පැවති මැතිවරණ සමඟ සැසඳීම අනුවන ක්‍රියාවක් නොවන්නේද?

## අහසේ මාළිගා හා දවල් සිහින

විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා කල ප්‍රකාශ කිහිපයක් පසුගිය ඉරිද , ලංකාදීප පත්‍රයේ පලවිය. හුදී ජනයාගේ ප්‍රසාද සංවේගය සඳහාත්, අළුත් අවුරුදු සමයේ විනෝදයක් අවශ්‍ය නිසාත්, එයින් කිහිපයක් අනුපිලිවෙලින් ලියා දක්වමු.

01 වික්‍රමසිංහ මහතා හිගුරන්ගොඩ ගියේය. එ.ජා.ප. අපේක්ෂක අර්ල් ගුණසේකර මහතා මෙසේ කීය.

"සර්.. මේ ගොවීන්ට වී විකුනන්ඩ බැරිවෙලා තියෙනවා. වී මාපියාව, තොගය අඩු මිලටයි වී ගන්නේ."

ඊට පිලිතුරු දුන් විපක්ෂ නායකවරයා මෙසේ කීය.

"අර්ල් මිනිස්සුන්ට කියන්න වී විකුණන්න එපා කියලා. 8 වනද අපි බලයට ආවහම සම්බ වී කිලෝවකට රු. 40 ක් නාඩු කිලෝවක් රු. 25 ටත් මිලදී ගන්නව කියල කියන්න. ටික දවසක් ඉවසන්න කියන්න.

02 තවත් තැනකදී වික්‍රමසිංහ මහතා මැතිවරණ අනාවැකිය ප්‍රකාශ කලේය. "අපිට අඩුම ගානේ ආසන 85 ක් හම්බ වෙනවා. දෙමළ සන්ධාන මන්ත්‍රිවරුන්ටත් 20 ක් විතර හම්බ වෙනවා. ජනරාල් වරයාගේ පක්ෂයට ආසන 10 ක් හෝ 15 ක් හම්බවෙනවා. ඒ නිසා අපිට ලෙහෙසියෙන්ම ආණ්ඩුවක් තියන්න පුළුවනි.

03 තවත් තැනකදී විපක්ෂ නායකයා මෙසේ කීවේය.
"අනෝමා ෆොන්සේකා මැතිනිය මා සමඟ කීවේ, මේ අවුරුද්දේ සිංහල අවුරුද්දට එතුමියගේ නිවසේ, කිරිබත් පිසිය නොහැකි බවය. මම එතුමියට කිව්වා, කිසිම සැකයක් නෑ ඔබතුමි කැවුම් කිරිබත් උයන්න ලැහැස්ති වෙන්න 8 ද අපි ආණ්ඩුව පිහිටවු පසුව ජනරාල් නිදහස් අපි ඔක්කොම කැවුම් කිරිබත් කෑවැහැකි. (මේ සියල්ල ඉරිද ලංකාදීපයෙන් උපුටා ගතිමි)

"කාසිපනම් මොටද හලෝ අහසෙ මාලිගා හදන්න."

අහසේ මාලිගා හදන අතරම, වික්‍රමසිංහ මහතා, ඉතා වටිනා ප්‍රකාශයක්ද කර තිබේ. ඒ ප්‍රකාශයෙන් ප්‍රයෝජන ගැනීම දැන් පැවරී ඇත්තේ ජනාධිපති තුමාටය.

ඉහත කී ගණන් බැලීම් ප්‍රකාශයට පත්කරන අතර, වික්‍රමසිංහ මහතා මෙසේද කියා ඇත.

"අපිට එන බහුතරය හැර, මම සන්ධානය මන්ත්‍රිවරුටත් ආරාධනය කර කියනව, බෙදිල හිටිය ඇති, දැන් රට හදන්න අපිත් එක්ක එකතු වෙන්න කියා."

එ.ජා.පක්ෂයෙන් තේරී පත්වු මන්ත්‍රිවරුනි, රට හදන්න, ඔබටත් එක්විය හැකි නේද?



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්
ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්.පියසේන




Coaching in English/
English Literature/IELTS
Northern Suburbs

- Classes conducted by a qualified and experienced teacher
- Exam oriented Individual & small group classes
- Effective methods with up to date materials

Call Savithri on 0431742696